# 1
# බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්

بِسْمِ اللهِ الرَّحْمٰنِ الرَّحِيْمِ

## බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්

"පරම දයාවන්ත වූ ද අපරිමිත කරුණාවන්ත වූ ද අල්ලාහ්ගේ නාමයෙන් ආරම්භ කරමි" කියා පවසමු.

මෙසේ කී විට අපට අල්ලාහ්ගේ දයාව හා කරුණාව හිමිවෙනවා.

# 2
# අල්ලාහ්ගේ නාමයෙන් ආරම්භ කරමු



කියමු අපි සැම
බිස්මිල්ලාහ්

අරඹමු සැම දේ කියා
බිස්මිල්ලාහ්

කෑමට පෙර කියමු අපි
බිස්මිල්ලාහ්



ඇඳීමට පෙර කියමු අපි
බිස්මිල්ලාහ්

උගනිමු අපි කියා
බිස්මිල්ලාහ්

ලියමු අපි කියා
බිස්මිල්ලාහ්


නොමිලේ බෙදා හැරීම සඳහා ය.



කියවමු අපි කියා
බිස්මිල්ලාහ්

අරඹමු අපි වැඩ කියා
බිස්මිල්ලාහ්

නින්දට පෙර කියමු අපි
බිස්මිල්ලාහ්



ඇහැරුණ විගස කියමු අපි
බිස්මිල්ලාහ්

අරඹමු සැම අපි නමින්
අල්ලාහ්

හැම යහපත් වැඩක් ම බිස්මිල්ලාහ් කියා ආරම්භ කරමු. එයින් අල්ලාහ්ගේ දයාව හා කරුණාව ලබා ගනිමු.

# 3
# අපේ ආරක්ෂකයා අල්ලාහ් ය

أَعُوْذُ بِاللهِ مِنَ الشَّيْطَانِ الرَّجِيْمِ

**අඌදු බිල්ලාහි මිනෂ් ෂයිතාන් නිර්රජීම්**

අල්ලාහ්ගෙන් ආරක්ෂාව පතමු.







# 4
# අල්හම්දු ලිල්ලාහ්

اَلْحَمْدُ لِلّٰهِ



**අල්හම්දු ලිල්ලාහ්**

**සියලු පැසසුම් අල්ලාහ්ට ය.**

සතුටෙ දි කියනා
අල්හම්දු ලිල්ලාහ්
දුකේ දි කියනා
අල්හම්දු ලිල්ලාහ්

ස්තුති කරන්නට
අල්හම්දු ලිල්ලාහ්
ප්‍රශංසා කළ විට
අල්හම්දු ලිල්ලාහ්

දායාද ලැබුණා ම
අල්හම්දු ලිල්ලාහ්
දුක නැති වුණා ම
අල්හම්දු ලිල්ලාහ්

හෙව්ව දේ ලැබුණා ම
අල්හම්දු ලිල්ලාහ්
ඕනෑ දේ ලැබුණා ම
අල්හම්දු ලිල්ලාහ්

# 5
# ලාඉලාහ ඉල්ලල්ලාහ්

لَا إِلٰهَ إِلَّا اللهُ



**ලාඉලාහ ඉල්ලල්ලාහ්**
දික්රය පවසමු.
**ලාඉලාහ ඉල්ලල්ලාහ්**
නැමදුමට සුදුස්සා අල්ලාහ් පමණි.
**ලාඉලාහ ඉල්ලල්ලාහ්**
සලාතය කළ යුත්තේ අල්ලාහ්ට පමණි.

# 6
# අල්ලාහ් විශ්වාස කරමු

අල්ලාහ් ඒකයා ය.

ඔහු කරුණාවන්තයි.

ඔහු අනුකම්පා කරයි.

හැම දේ ම පරිපාලනය කරයි.

හැම දෙයක් ම අපට දෙන්නේ ඔහුයි.

අපි හැම විට ම ඔහු නමදිමු.

ඔහුගෙන් ම දුආ ඉල්ලමු.





නොමිලේ බෙදා හැරීම සඳහා ය.

# 7
# කලීමා තයිබා

لَا إِلٰهَ إِلَّا اللّٰهُ
مُحَمَّدٌ رَّسُوْلُ اللّٰهِ

**ලාඉලාහ ඉල්ලල්ලාහු**
**මුහම්මදුර් රසූලුල්ලාහි**

# 8
# පිරිසිදු ව ඉඳිමු



දත් මදිමු.

අත් පා මුහුණ සෝදමු.





දිය නා ශරීරය පිරිසිදු ව
තබා ගනිමු.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

හිස පීරමු.



නිය පොතු කපමු.



පිරිසිදු ව ඉන්න අයට අල්ලාහ් කැමති ය.

වැසිකිළියට යන විට පාවහන් පලඳිමු.



වැසිකිළියට වතුර ගසා පිරිසිදු ව තබමු.

වැසිකිළියට යන්නට
පෙරත් ගොස් ආ පසුත්
පිරිසිදු කර ගැනීම
හොඳ පුරුද්දක්.

මල පහ කළ පසු
සබන් ගා අත් සෝදා ගනිමු.

අන් අයට භාවිත කළ හැකි අන්දමට
වැසිකිළිය පිරිසිදු ව තබමු.

# 9
# නිවස හා අවට පරිසරය



අපි නිවස පිරිසිදු ව හා අලංකාර ව තබමු.
නිවස පිරිසිදු ව තබා ගැනීමට උදවු කරමු.

අපි භාවිත කරන උපකරණ නිසි අයුරින්, පිරිසිදු ව හා අලංකාර ව තබමු.

# 10
# පන්තිය පිරිසිදු ව තබා ගනිමු



අපි අපේ පන්තිය පිරිසිදු ව තබා ගනිමු.

එහි ඇති දේ නියමිත තැන්වල ම තබමු.

කුණු කසළ බඳුන්වලට දමමු.

ලී බඩුත් උපකරණත් පිරිසිදු ව
ලස්සනට තබා ගනිමු.

වටපිටාව පිරිසිදු ව තබා ගන්න උදවු කරමු.



එය අලංකාර ව තබා සතුටු වෙමු.

# 11
# ආහාර අනුභව කරමු

කෑමට පෙර අත් සෝදමු.

කෑම කෑමෙන් පසුවත් අත් සෝදමු.

සබන් ගා අත් සෝදමු.





වාඩි වී කෑම කමු.

කෑමට පෙර නියම උසුරුම පවසමු.



වතුර බොන විට ටික ටික බොමු.



කෑම ගැනීමෙන් පසුවත්
ජලය බීමෙන් පසුවත්
අල්හම්දු ලිල්ලාහ්  කියා අල්ලාහ්ට ස්තුති කරමු.

# 12
# ඇඳුම් අඳිමු

අපි කැමැත්තෙන් ඇඳුම් අඳිමු.

ගසා දමා ඇඳුම් අඳිමු.



දකුණු පසින් ඇඳුම් අඳින්නට පටන් ගනිමු.



වම් පසින් ඇඳුම් ගලවන්න පටන් ගනිමු.



වරක් ඇඳපු ඇඳුම සෝදමු.
ඇඳුම නවා පිළිවෙළට තබමු.

අඳින ගලවන වෙලාවට
දුආ උසුරා සැනසුම ලබමු.

# 13
# හොඳ දරුවන් ලෙස ජීවත් වෙමු

මම හැම දා ම උදෑසන අවදි වෙනවා.
අත් පා සෝදා නා පිරිසිදු වෙනවා.

අල් කුර්ආන් පාරායනයේ යෙදෙනවා.
අනෙක් අයගේ පාරායනා අසා සිටිනවා.





වැඩිහිටියන්ට සලකනවා.
අහල පහළ අයට උදවු වෙනවා.

හොඳ දේ කරන්නට කැමැති වෙනවා.
අයහපත් දේවලට මම අකැමැති වෙනවා.

ස්වර්ග ජීවිතය පතනවා.
නිරයේ ජීවිතයෙන් බේරෙනවා.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

# 14
# දෙමව්පියන්ට ගරු කරමු



දෙමව්පියන්ට සලකමු.

දෙමව්පියන්ට කීකරු වෙමු.

නෑදෑයන් සමග සමගියෙන් ඉඳිමු.

නෑදෑයන්ට, අසල්වැසියන්ට උදවු කරමු.

# 15
# ගුරුවරුන්ට ගරු කරමු



ගුරුවරුන්ට ආදරය කරමු.
ඔවුන්ට අපි ගෞරව කරමු.

ගුරුවරුන්ගේ මග පෙන්වීම අනුව වැඩ කරමු.

# 16
# සමගියෙන් ජීවත් වෙමු

සැවොම එක් ව ජීවත් වෙමු.

සමගියෙන් ජීවත් වෙමු.

අන් අය සමග එක් ව කෑම කමු.

එක් ව සෙල්ලම් කරමු.



# 17
# අපේ නබිතුමා
# මුහම්මද් සල්ලල්ලාහු අලයිහි වසල්ලම්-I

මුහම්මද් සල්ලල්ලාහු අලයිහි වසල්ලම් අපේ නබි තුමා ය.

එතුමා ඉපදුණේ මක්කම නගරයේ ය.

එතුමාගේ මවගේ නම ආමිනා ය.

පියාගේ නම අබ්දුල්ලාහ් ය.




නොමිලේ බෙදා හැරීම සඳහා ය.

# අපේ නබිතුමා
# මුහම්මද් සල්ලල්ලාහු අලයිහි වසල්ලම් - II

නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම්තුමා කුඩා කාලයේ පටන් ම ඇත්ත කතා කළා.

මිනිස්සු එතුමාට අස්සාදික් කීවා.

නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම්තුමා කුඩා කාලයේ පටන් ම අවංක ව වැඩ කළා.

මිනිස්සු එතුමාට අල්අමීන් කීවා.

නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම්තුමා මදීනාවේ දී වෆාත් වුණා.



අපිත් සැම වේලාවක ම ඇත්ත කතා කරමු.

අවංක ව වැඩ කරමු.

# 18
# සලවාත් කියමු

නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම්තුමාගේ නම ඇසුණා ම එතුමාට සලවාත් කියමු.

صَلَّى اللّٰهُ عَلَى مُحَمَّدٍ

صَلَّى اللّٰهُ عَلَيْهِ وَسَلَّمَ

**සල්ලල්ලාහු අලා මුහම්මද්**

**සල්ලල්ලාහු අලයිහි වසල්ලම්**

# 19
# අල් කුර්ආනය පාරායනය කරමු



අපේ ආගමික  ග්‍රන්ථය අල් කුර්ආනයයි.

එය අපට යහ මග පෙන්වන ග්‍රන්ථයයි.

අල් කුර්ආනය අල්ලාහ්ගේ කලාමයයි.

එය නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම්තුමා වෙත පහළ කරන ලදි.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම්තුමා අපට එය කියා දුන්නා.

දිනපතා අල් කුර්ආනය පාරායනය කරමු.



අල් කුර්ආන් පාරායනය අසා සිටිමු.



## 20
## සූරා අල් ෆාතිහා




සූරා ෆාතිහාව හැම දා ම පාරායනය කරමු.

එයින් අපට අල්ලාහ්ගේ බරකතයත් රහ්මතයත් ලැබෙනවා.



නොමිලේ බෙදා හැරිම සඳහා ය.

# 21
# මස්ජිදය

මේ මස්ජිදයකි. මෙය අල්ලාහ්ගේ මාළිගයයි.

අපි මෙහි දී අල්ලාහ් නමදිමු.



මෙය පූජනීය ස්ථානයකි.

හැම වේලාවේ ම මස්ජිදය පිරිසිදු ව තබා ගනිමු.

මෙහි දී සාමය පතමු.

මස්ජිදය ඇතුළට පිරිසිදු ව යා යුතුයි.

මස්ජිදයේ දී ඉමාම්වරයා සලාතය පවත්වනවා.

ඉමාම් සලාතය පවත්වනු ලබන තැන මිහ්රාබ් යැයි හැඳින්වෙනවා.




මෙහි ධර්ම දේශනා පවත්වනු ලබනවා.
ධර්ම දේශනා පවත්වනු ලබන තැන මිම්බර් යැයි හැඳින්වෙනවා.



මස්ජිදයට ඇතුළු වන විට අත්පා සෝදා වුලූහ් කරනවා.
වුලූහ් කිරීමට හවුල් සාද තියෙනවා.

මස්ජිදයේ උස් මිනරා තිබෙනවා.



අපිත් සලාතය ඉටු කිරීමට මස්ජිදයට යමු.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

# 22
# ඉමාම් ගස්සාලි (රහ්)



ඉමාම් ගස්සාලි ලෝක ප්‍රසිද්ධ උගතෙක්. එතුමා ඉපදුණේ පර්සියාවේ. එතුමා ඉගෙන ගන්න බැග්ඩෑඩ් නගරයට ගියා.

දිනක් බැග්ඩෑඩ් නගරයේ සිට ආපසු එන අවස්ථාවේ අතර මග දී හොරු කණ්ඩායමක් එතුමාට මුණ ගැසුණා. ඔවුන් එතුමා සතු දේවල් පැහැර ගත්තා.

ඉමාම් ගස්සාලි හුඟක් දුක් වුණා. තමාගේ පොත්පත් ආපසු දෙන ලෙස ඔහු ඉල්ලා සිටියා.

ඔබ උගත් දේ පොත්පත්වල ද තියෙන්නේ කියා හොරු ඇසුවා.

ඉමාම් ගස්සාලි කල්පනා කරන්න වුණා. උගත් දේ පොත්පත්වල පමණක් නොව මතකයේ ද තබා ගන්න ඕනෑ කියා එතුමාට වැටහුණා.

එතුමා තමා උගත් දේ මතකයේ තබාගෙන ක්‍රියා කළා.

එතුමා වගේ අපිත් ඉගෙන ගත්ත දේවල් මතකයේ තබා ගනිමු.

ඒවා අපේ එදිනෙදා ජීවිතයේ දී ක්‍රියාවට නංවමු.